**දක්ෂිණ අධිවේගයේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය - 2014**

**-----------------------------------------------------------------**

දක්ෂිණ අධිවේගයේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 1995 නොවැම්බර් 09 දින එළඹි අංක 8271- එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ 25.2 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-------------------------------------------------------------------------------**

ප්‍රදාන ගිවිසුමට අනුව ව්‍යාපෘතිය, එවකට වරාය, මහා මාර්ග හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අධිවේගී මාර්ග සංවර්ධනය සහ මෙහෙයුම් සඳහා ආයතනික හා ප්‍රතිපත්ති රාමුව වැඩි දියුණු කිරීම මෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගයේ තාක්ෂණික, වාණිජ, මූල්‍ය සහ ආර්ථික හා ආරක්ෂාව පිළිබඳ අංශ ඇතුළත් ශක්‍යතා අධ්‍යයනය හා මූලික සැලසුම සකස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 130 කට සමාන එජඩො මිලියන 1 කි. ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය රාමුව යටතේ 1995 නොවැම්බර් 09 දින ව්‍යාපෘති ගිවිසුමට එළඹ තිබුණද, ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මාසයේදී ආරම්භ කළ අතර 2014 ජූනි වන විට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය එහි කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ

සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ දායකත්ව නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව,මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

කාර්යාල ගොඩනැඟිල්ලක් කුලියට ගැනීම සඳහා සිදු කළ රු. 320,000 ක ආපසු ගෙවිය යුතු තැන්පතු වටිනාකම ගිණුම් වලට ගෙන නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

----------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම** | **අරමුදල් උපයෝජනය** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | **2014 වර්ෂය තුළ** | | **2014 දෙසැම්බර් 31 දිනට** | |
| | **එජඩො මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
| ආ.සං.බැ. | 1.0 | 130 | 85 | 0.13 | 16.45 | 0.13 | 16.45 |
| ශ්‍රී.ලං.ර | - | - | 20 | - | 16.72 | - | 20.12 |
| මා.සං.අ.ණය | - | - | - | - | 3.00 | - | 3.00 |
| | <u>1.0</u> | <u>130</u> | <u>105</u> | <u>0.13</u> | <u>36.17</u> | <u>0.13</u> | <u>39.57</u> |

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

සංරචක 03 ක් මගින් ව්‍යාපෘතියේ අරමුණු ලඟා කර ගැනීමට අපේක්ෂා කළ අතර ඒ සඳහා රු. මිලියන 130 කට සමාන එජඩො මිලියන 1.00 ක ප්‍රතිපාදනයක් කර තිබුණි. කෙසේ වෙතත් එක් එක් සංරචකය සඳහා එම වෙන් කිරීම් කර නොතිබුණු අතර ඒ අනුව විස්තරාත්මක මූල්‍ය සැලසුම් සකස් කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ පළමු සංරචකය යටතේ අධිවේගී මාර්ගය සංවර්ධනය සහ නඩත්තු කටයුතු වෙනුවෙන් ආයතනික හා ප්‍රතිපත්ති රාමු වැඩ සවිබල ගැන්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය විසින් විශේෂඥයන්ගේ සේවය ලබාගෙන තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වෙත 2013 නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කර තිබුණද එවැනි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගත් බවට තොරතුරු කිසිවක් නොලැබුණි.

(ආ) ව්‍යාපෘතියේ දෙවන සංරචකය යටතේ ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය සඳහා සුදුසු ඉදිකිරීම් තාක්ෂණයන්, දේශීය හෝ විදේශීය පුහුණු වැඩසටහන් සකස් කිරීම, නිර්දේශ කිරීම හා ලබා දීම මගින් කළ යුතුය. ඉදිකිරීම් තාක්ෂණයන්ගේ වාර්තාව 2013 නොවැම්බර් මාසයේදී සකස් කර ඉදිරිපත් කර තිබුණු අතර මාර්ගවල නව ඉදිකිරීම් තාක්ෂණයන් සඳහා ගොඩනගන ලද යාන්ත්‍රනයන් වෙනුවෙන් තොරතුරු කිසිවක් ලැබී නොතිබුණි.

(ඇ) දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් හා මූලික සැලසුම් සකස් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම මෙන්ම ක්‍රියාත්මක කිරීමේ සූදානම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ තුන්වන සංරචකය යටතේ අපේක්ෂිත විය. කෙසේ වෙතත් ශක්‍යතා අධ්‍යයනය හා පවතින අධිවේගී මාර්ග ජාලය සමඟ කොළඹ නගරය සම්බන්ධ කිරීමට දක්ෂිණ අධිවේගය දීර්ඝ කිරීමේ යෝජිත සලකුණු කිරීම් වල මූලික ඉංජිනේරු වැඩ පමණක් සිදු කර තිබුණි.